## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2017

-----------------------------------------

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නාලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් පිළියෙල කරන බවට ගිණුම් ප්‍රතිපත්ති මගින් අනාවරණය කර තිබුණද, ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ පවත්වාගෙන යනු ලබන බාහිර පාඨමාලා මගින් ලැබෙන ආදායම්, මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නැනෝ තාක්ෂණ විද්‍යාගාරය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2016 දෙසැම්බර් 30 දින කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 1,742,595 ක අත්තිකාරම් මුදල, 2017 මැයි 18 දින කොන්ත්‍රාත්කරු විසින් පියවා තිබුණද, එම මුදල සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් අයවිය යුතු අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය හා මාකඳුර පරිශ්‍රවල වූ වෛද්‍ය මධ්‍යස්ථානවල 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 93,643 ක් වූ ඖෂධ තොග අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයට අදාලව, මාකඳුර පරිශ්‍රයේ සවිකර ඇති දුරකථන කුළුණ සඳහා එම ආයතනයෙන් ලැබියයුතු බදුකුලී සහ විදුලි ගාස්තු පිළිවෙලින් රු.42,350ක් සහ රු.169,510 ක්ද පිරිසිදු කිරීමේ ආයතනයට ගෙවිය යුතු රු. 1,229,656 ක්ද ගිණුම් ගත කිරීම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඈ) ප්‍රාග්ධන ප්‍රදානවලින් මිලදී ගත් වත්කම් ක්‍රමක්ෂය කිරීමේදී එම වත්කමට අදාල ප්‍රදාන වටිනාකමට ක්‍රමක්ෂය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රමක්ෂය ගණනය කිරීම, ගොඩනැගිලි හැර වත්කම්වල ප්‍රත්‍යාගණන අගය මත සිදු කිරීම නිසා රු.68,697,000 ක් වැඩියෙන් ක්‍රමක්ෂය ගැලපීම් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රු.253,891,149 ක් වූ වියදම් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

වටිනාකම රු.408,276,027 ක් වූ ඉඩම් අක්කර 37 රූඩ් 02 පර්චස් 04 ක් සම්බන්ධයෙන් ඔප්පු / පැවරුම් නියෝග විගණනයට ඉදිරිපත් නොවීය.

### 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ ණයගැති සහ නේවාසිකාගාර ගාස්තු පිළිවෙලින් රු. 31,330 ක් සහ රු. 261,867 ක් වර්ෂ 04 සහ වර්ෂ 7 ත් වර්ෂ 13 ත් අතර කාල පරාසයක සිට හිඟව පැවතුනි.

(ආ) එකතුව රු.159,740 ක් වූ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල ණය ශේෂ 03 ක් වර්ෂ 09 කට වැඩි කාලයක සිට අයවීමකින් තොරව පැවතුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම්වල දැක්වෙන වර්ෂ 01 සිට වර්ෂ 02 දක්වා සහ වර්ෂ 02 ට වැඩි පිළිවෙලින් රු. 352,850 ක් හා රු.374,270 ක් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 වගන්තිය හා 2005 ජූලි 13 දිනැති අංක 30 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පත්වල රු.26,000,000 ක් ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 770 හා 772 | දීර්ඝ කාලයක් තිස්සේ නිකුත් නොවන සහ භාවිතයට නොගන්නා වටිනාකම රු.428,452 ක්වූ තොග අයිතම 74 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිතවන අරමුදල් භාවිතය සඳහාවන මගපෙන්වීම අනුව පිරිවැය ආවරණය සහ ලාභදායි නොවන පදනම මත ස්වයං මූල්‍ය පාඨමාලා පවත්වා ගතයුතු වුවත් පාඨමාලා 17 ක වියදම් ඉක්මවා රු.21,668,562 ක අතිරික්තයක් ඇති වී තිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.7,295,596 ක්වූ පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2016 අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබා දී තිබුණු රු.50,000,000 ක් වූ මුදලින් ඉතිරිව තිබූ රු. 21,148,762 ක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව වත්කම් අත්පත් කරගැනීම සඳහා වැයකර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 67,708,979 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 204,029,628 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම රු.136,320,649 කින් අඩුවී තිබුණි. ක්ෂය රු.126,389,000 කින් වැඩිවුවද ක්‍රමක්ෂය හා පරිත්‍යාග රු.312,516,000 කින් වැඩිවීම ඉහත පිරිහීම අඩුවීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.135,852,595 ක්වූ ඌනතාවය උච්ඡාවචනයන් සහිතව සමාලෝචිත වර්ෂයේදී රු.67,708,979 ක ඌනතාවයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.371,793,368 ක්වූ මණ්ඩලයේ හිතකර දායකත්වය 2017 වර්ෂයේදී රු.1,071,768,057 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016/17 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ පීඨ 05 ක් සඳහා බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 1245 ක් වුවත් එම අධ්‍යයන වර්ෂ සඳහා බඳවාගෙන තිබුණේ සිසුන් 1084 ක් එනම් සියයට 87 කි. පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨය සඳහා 2016/17, 2015/16 හා 2014/15 අධ්‍යයන වර්ෂ සඳහා බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 170 ක් වුවත් බඳවාගෙන තිබුණේ පිළිවෙලින් 91 , 89, 94 දෙනෙකු ලෙස ඉතා අඩු සිසුන් ප්‍රමාණයක් එනම් සියයට 55 කට අඩු ප්‍රතිශතයකි.

(ආ) විශ්වවිද්‍යාලයේ එකිනෙක පීඨයන්හි 2017 වර්ෂයේ උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාවද, සම්මත හා තථ්‍ය අනුපාතයන්ද පහත දැක්වේ.

| පීඨය | උපාධි අපේක්ෂක සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය | | අනුපාතයන් | |
|---|---|---|---|---|---|
| | | සම්මත | තථ්‍ය | සම්මත | තථ්‍ය |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 602 | 60 | 39 | 10:1 | 15:1 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 642 | 64 | 40 | 10:1 | 16:1 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 1853 | 103 | 35 | 18:1 | 53:1 |
| පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 455 | 46 | 35 | 10:1 | 13:1 |
| තාක්ෂණ පීඨය | 311 | - | 04 | - | - |

විශ්වවිද්‍යාලය විසින් පවත්වාගත යුතු ශිෂ්‍ය හා ආචාර්යවරුන්ගේ අනුපාතය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති අතර, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සම්මත හා තථ්‍ය කාර්ය මණ්ඩල විචලනයේ අනුපාතය සියයට 194 ක් වැනි ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී සමාජගතව සිටින උපාධිධාරීන්ගෙන් ලබාගෙන තිබූ තොරතුරු අනුව උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පීඨය | රැකියාවක නියුක්ත ප්‍රතිශතය |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 58 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 77 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 62 |
| පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 79 |

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) උපාධිධාරීන්ගේ ඉහත සේවානියුක්තිය පිළිබඳ සමීක්ෂණය අවසන් වසර විභාග නිමවී මාස 02 ක්වූ සුළුකාලයක් තුල සිදුකර තිබුණු අතර, ලබාගෙන තිබූ අදාළ දත්ත මගින් සිසුන්ගේ රැකියා නියුක්තිය හා වියුක්තිය පෙන්නුම් කළද තමන් විසින් ලබාගෙන තිබූ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව රැකියාවල නියුක්තිය ගණනය කර නොතිබුණි.

(ii) ලෝක ශ්‍රේණිගත කිරීම් (World if Universities Ranking) සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව 2016 වර්ෂයේදී වයඹ විශ්වවිද්‍යාලය පිළිවෙලින් 5409 හා 10 වන ස්ථාන හිමිකරගෙන තිබුණු අතර, 2017 වර්ෂයේදී පිළිවෙලින් 5791 හා 08 වන ස්ථාන හිමිකරගෙන තිබුණි.

(iii) 1999 වර්ෂයේදී ආරම්භ කර තිබෙන පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයෙන් 2013 වර්ෂය වනවිට උපාධිධාරීන් 350 ක් සිය උපාධි පාඨමාලා අවසන් කර තිබුණද, පෝෂණවේදීන් වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට බඳවාගෙන තිබෙන ප්‍රමාණය 18 දෙනෙකු පමණක් වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන 02 (කුලියාපිටිය හා මාකඳුර) සඳහා වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකුගේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණද ස්ථිරව එක් වෛද්‍ය නිලධාරියෙකු හෝ බඳවාගෙන නොතිබුණි. කෙසේ වුවද, වෛද්‍ය මධ්‍යස්ථානය මගින් සිදුකල යුතු ප්‍රතිකාර කටයුතු කුලියාපිටිය රෝහලෙන් ගෙන්වා ගත් වෛද්‍යවරයෙකු මගින් සිදුකරන අතර ඒ වෙනුවෙන් එම වෛද්‍යවරයා වෙත සමාලෝචිත වර්ෂයේදී රු.1,690,000ක් ගෙවා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ බැංකු ජංගම ගිණුමකට අදාලව සමාලෝචිත වර්ෂයේදී සෘජු ලැබීම් රු.124,500 ක්වූ අතර ඒවා හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) තක්සේරු වටිනාකම රු. 3,835,000 ක්වූ පර්චස් 711 ක ඉඩම් කොටස් 08 ක් පවරා ගැනීම වෙනුවෙන් 2013 වර්ෂයේදී රු. 1,013,750 ක් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත තැන්පත් කර ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකෙරෙමින් පවතින රු. 77,872,750 කට තක්සේරු කර ඇති අක්කර 28 පර්චස් 12.84 ක භූමිය පවරා ගැනීමේ කටයුතු සඳහා විශ්වවිද්‍යාලය විසින් 2016 වර්ෂයේදී රු.16,500,000 ක් කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබූ අතර, අදාල පවරා ගැනීමේ කටයුතු 2017 වර්ෂය අවසන් වන විටද නිම වී නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය හා කාර්යමණ්ඩල නේවාසිකාගාර ඉදිකිරීම සඳහා මාකඳුර පරිශ්‍රයේ අක්කර 05 ක මහයාය වත්ත ඉඩම මිළ දී ගැනීම සඳහා 2013 ජුලි 10 දින පොල් පර්යේෂණ ආයතනය වෙත රු.මිලියන 10 ක් ගෙවා තිබුණද ඒ සඳහා විකුණුම්කර ඔප්පුවක් ලබාගෙන නොතිබුණි.

(ඊ) වර්ෂ 03 ක පර්යේෂණ කාලයක් තුල කටයුතු කර පර්යේෂණ වාර්තා ලබාදීමේ එකඟතාවය මත 2014 වර්ෂයේදී රු.324,535 ක්වූ පර්යේෂණ දීමනා ලබාගෙන තිබූ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකාවක් සිය පර්යේෂණ කාලය අවසන්ව තිබුණද, 2018 අගෝස්තු මාසය වන විටත් පර්යේෂණ වාර්තාව විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන අනුමත කාර්යමණ්ඩලය පිළිවෙලින් 376 දෙනෙක් හා 491 දෙනෙක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය පිළිවෙලින් 284 දෙනෙක් හා 373 දෙනෙක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 94 දෙනෙක් හා 119 දෙනෙක් වූ අතර අතිරික්තය පිළිවෙලින් දෙදෙනෙක් හා එක් අයෙකු විය.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද 2017 වර්ෂයේ කාර්ය මණ්ඩල වාර්තාව අනුව සමස්ථ කාර්ය මණ්ඩල පුරප්පාඩුව සියයට 25 ක් වන අතර ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය සියයට 29 ක් පුරප්පාඩු වී තිබුණි. මේ හේතුවෙන් ආයතනයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට අත්‍යවශ්‍ය වූ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල අවශ්‍යතාවය අධ්‍යයනය කර, කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාවක් සකස් කර තිබුණද 2018 වර්ෂයේදී සිසුන් 75 ක් බඳවා ගැනීමට නියමිතව ගොඩනැගිලි ඉදිකෙරෙමින් පවතින වෛද්‍ය පීඨය සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සමාලෝචනය කර බඳවා ගැනීම් සඳහා සැළසුම් පිළියෙල කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී කුලියාපිටිය පරිශ්‍රයේ හා මාකඳුර පරිශ්‍රයේ පවත්වාගෙන යන තාක්ෂණ පීඨයට අදාළ තාක්ෂණවේදී පාඨමාලා 03 ට බඳවාගෙන තිබූ සිසුන් සංඛ්‍යාව 234 ක් වූ අතර ඉදිරි වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී සිසුන් 246 ක් ලියාපදිංචි කර තිබුණි. එහෙත් එම පාඨමාලා සඳහා අවශ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩලය තීරණය කර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.500,000 ක්වූ වෑන් රථයක් 2014 වර්ෂයේ සිට ධාවන කටයුතු සඳහා යොදවා නොගෙන විශ්වවිද්‍යාල පරිශ්‍රයේ නවතා තිබුණි.

(ආ) මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා 2015 වර්ෂයේදී රු.680,042 ක්වූ වෛද්‍ය උපකරණ මිලදීගෙන තිබූ අතර එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව වයඹ විශ්විද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාව මගින් ආයතනයේ විෂයපථයට සමගාමීව සහකාර අභ්‍යන්තර විගණන නිළධාරියෙක් හා විගණන සහායකයින් 04 දෙනෙකු නිර්දේශ කර තිබුණද වරින් වර වැඩ බැලීමේ පදනමින් සහකාර අභ්‍යන්තර විගණන නිලධාරියෙකු හා විගණන සහායකයෙකු පත් කර තිබුණි. මෙලෙස අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට බාධාවක් වී තිබුණි.

(ආ) 2015 හා 2016 වර්ෂවල විගණන වැඩසටහන් අනුව ශිෂ්‍ය ඉගැන්වීම් කටයුතු සඳහා කථිකාචාර්යවරුන් යෙදවීම පිළිබඳ පරීක්ෂාව හා ඇගයීම සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් ගෙවීම්වලට අදාල වවුචර් හා ලිපිගොනු අවසන් ගෙවීමට ප්‍රථම පරීක්ෂාකරද නොතිබුණි.

## 6.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කර්මාන්ත 24 ක 2016 දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ වටිනාකම රු.68,661,154 ක් ලෙස පැවති අතර සමාලෝචිත වර්ෂයේදී එහි කිසිදු ප්‍රගතියක් දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ නිමකර තිබූ රු.26,516,869 ක ගොඩනැගිලි දැනට භාවිතයේ පැවතියද ඒවා අදාල වත්කම් ගිණුම්වලට මාරු කිරීමට පියවර නොගෙන නොනිමි වැඩ ලෙස තවදුරටත් දක්වා තිබුණි.

(ඇ) ව්‍යවහාරික විද්‍යාපීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම

---

2014 ජුලි 10 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොන්ත්‍රාත්කරු ඉදිරිපත්කල පිරිවැය ඇස්තමේන්තුව අනුව පිරිවැය රු.315,250,260 ක්වූ ව්‍යවහාරික විද්‍යාපීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2014 අගෝස්තු 29 සිට 2016 මාර්තු 29 දක්වා වූ කාලරාමුව තුල සිදුකළ යුතු බවට දන්වා තිබුණද 2016 මාර්තු 29 දින වනවිට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

(ii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 සැප්තැම්බර් 02 දිනැති අංක එම්ඊ/පීආර්/එම්ඔඑච්ඊ/ජීඊඑන් දරන ලිපිය ප්‍රකාරව ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාලය තුල ඉදිකිරීම් කටයුතු නිමකර නොමැති විට විශ්වවිද්‍යාලයේ උපකුලපතිට මාස 02 ක් දක්වා පමණක් කාල දිගු ලබාදිය හැකි වුවත්, අදාල කර්මාන්තයේ තවදුරටත් නිමකළ යුතු වැඩ කොටස් හා ඒවා නිමකරන ආකාරය දැක්වෙන විස්තරයක්ද ලබා නොගෙන පළමු කාල දිගුව 2016 සැප්තැම්බර් 30 දක්වා මාස 06 ක් හා දෙවන කාල දිගුව 2016 දෙසැම්බර් 31 දක්වා මාස 3 ක් වශයෙන් උපකුලපති විසින් දින දීර්ඝ කිරීම් අනුමත කර තිබුණි.

(iii) කොන්ත්‍රාත්කරු විසින් 2016 නොවැම්බර් 26 දින සිට 2016 දෙසැම්බර් 30 දක්වා කාලය තුල ඉටුකල වැඩ ඇතුලත් කර ඉදිකිරීම් නිමකල බවට 2017 මැයි 08 දින අවසන් බිල්පත් ඉදිරිපත් කර තිබුණද ඒ වනවිට වැඩ අයිතම 16 ක සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක ඉටු නොකල වැඩ පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) 2016 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කටයුතු නිමකර භාරදිය යුතු මෙම ගොඩනැගිල්ලේ වැඩ අයිතම 16 ක ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබියදී 2018 මැයි 08 දිනය සැලකූ විට ප්‍රමාද ගාස්තුව ලෙස රු.31,525,026 ක් අයකල හැකිව තිබියදී එය නොසලකා මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.315,250,260 ක් ආවරණය වන පරිදි 16 වන අතුරු ගෙවීම ලෙස 2017 මැයි 08 ඉදිරිපත් කළ බිල්පත සංශෝධනය කරමින් රු.13,913,000 ක් ගෙවීම්කර තිබුණි.

(v) ගොඩනැගිල්ලේ දුරකථන සහ ජාලගත පද්ධතිය (Network System) සඳහා වූ කටයුතු මහල් දෙකක පමණක් සිදුකර අදාල වැඩ විෂයය අත්හැර දමා තිබුණද, ඒ වෙනුවෙන් ඇස්තමේන්තුගත රු.1,775,000 ක්වූ මුළු මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(vi) ශ්‍රවනාගාරය ඇතුළත සම්පූර්ණ කළයුතු වැඩ කොටස් 3 ක් වෙනුවෙන් රු.3,800,000 ක් ගෙවා තිබුණද, එම කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි.

(vii) විෂයය අංක 32 අනුව රු.10,972,000 ක් ගෙවා තිබෙන ගොඩනැගිල්ලේ ඇතුළත වෙන්කිරීම් 3mm ඝණකම සහිත Compsite Board 02 කින් නිමකල යුතු වුවත්, ඊට අඩු ඝණකමින් යුත් Board ඒ සඳහා භාවිතා කර තිබුණි.

(viii) විෂයය අංක 38 අනුව Rain Water Disposal System වැඩ විෂයය සඳහා රු.1,977,437 ක්වූ මුළු මුදලම ගෙවා තිබුණද, අදාල කාර්යය සම්පූර්ණ කර නොතිබුණි.

**6.3 ප්‍රමාද වූ ව්‍යාපෘති**

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාකදුර වෛද්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් සමාගමක් සමග 2014 අගෝස්තු 17 දිනට නිම කිරීමේ එකඟතාවය මත 2013 ජනවාරි 17 දින රු.14,485,175 ක බදු රහිත වටිනාකමට ගිවිසුමකට එළඹ තිබුණි. අවස්ථා කිහිපයකදී අත්හැර දමනලද මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණීම හෝ ගිවිසුම් අවලංගු කර වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු ලවා කඩිනමින් ඉදිකිරීම් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම්ගත වටිනාකම රු.86,552,870 කින් නිමකිරීම සඳහා 2014 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර තිබුණු පරිපාලන ගොඩනැගිල්ලේ කටයුතු 2017 වර්ෂය අවසන් වන විටත් නිම වී නොතිබුණි.

**6.4 අයවැය පාලනය**

---------------------

2016 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන්කර නොතිබූ රු.52,282,156 ක්වූ ගෙවීම් පියවීම සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේද ප්‍රතිපාදන සළසාගෙන නොතිබුණි.

**6.5 නොවිසඳී ඇති විගණන ඡේද**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශගත වී නියමිත කාලය තුල ආපසු නොපැමිණි කථිකාචාර්යවරු දෙදෙනෙකුගෙන් 2011 වසරේ සිට අයවිය යුතු රු.3,172,714 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2017 නොවැම්බර් 28 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාවේ නියෝගයට අනුව පීඨ මගින් පවත්වාගෙන යන ස්වයං මූල්‍ය පාඨමාලාවලට අදාල ගිණුම්වල රු. 123,292,960 ක් වූ ශේෂයන් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ඉඩම්වල අයිතිය පවරා නොගැනීම හා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කරවා ගැනීමට කටයුතු නොකිරීම හා ඉදිකිරීම් වලට අදාළව නිම කරන ලද වැඩ වල වටිනාකම සඳහා බිල්පත් කඩිනමින් ලබාගෙන නිරවුල් කිරීමට හා වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | එක් එක් පීඨ සඳහා බඳවා ගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව බඳවාගෙන නොතිබීම |
| (ඈ) | අයවැය පාලනය | ලැබී තිබෙන ප්‍රතිපාදන උපයෝජනය කරන ආකාරය දැක්වෙන පරිදි අයවැය ලේඛනය පිළියෙල කර නොතිබීම |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් බඳවා නොගැනීම ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට බාධාවක් වීම. |